# සිංහල පද්‍ය සාහිත්‍යයෙහි ආරම්භක යුගයන්හි පැවති ස්වාධීන විචාර චින්තනය පිළිබඳ විමර්ශනයක්

ඉමේෂා මධුෂානි සපුතන්ත්‍රි[85]

සාහිත්‍ය නිර්මාණය හා විචාරය අවියෝජනීය ක්‍රියාවලියකි. 'වි' පූර්ව 'චර්' ධාතුවෙන් සැකසෙන 'විචාර' යන වදනින් හැඟවෙන්නේ 'නිර්මාණයක විශේෂ වශයෙන් හැසිරීම' යන්න යි. සිංහල විචාර මාර්ගය උද්භවය වීමට සංස්කෘත විචාර ක්‍රමවේද සමීප ලෙස බලපෑවේ ය. සිංහල සාහිත්‍යයේ අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි දී රචිත සීගිරි ගී, සියබස්ලකර, මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ ආදි ග්‍රන්ථ වර්තමානයේ ද අවශිෂ්ට ව පවතී. පාලි හා සංස්කෘත භාෂා, සිංහල සාහිත්‍යයේ සමාරම්භක අවධියේ සිට ම සාහිත්‍ය කෘතිවල භාෂා ශෛලිය සකස් කරගැනීමට බලපා ඇත. සාහිත්‍ය නිර්මාණ මෙන් ම තත්කාලීන විචාරය ද හැඩගැස්වීමට සංස්කෘත සාහිත්‍ය හා විචාරය සමීප සදාශ්‍රයක් වූයේ ය. සාහිත්‍ය නිර්මාණ අතරින් සංස්කෘත සාහිත්‍යයේ ආලෝකය වඩාත් ප්‍රකට වන්නේ සමකාලීන සිංහල පද්‍ය සාහිත්‍යයෙනි. එසේ වුව ද අනුරාධපුර හා පොළොන්නරු යුගවල දී රචිත පද්‍ය කෘති විමර්ශනයේ දී ප්‍රත්‍යක්ෂ කරගත හැකි කරුණ වන්නේ සාහිත්‍ය කෘතිවලින් විචාරාත්මක චින්තනයක ලක්ෂණ ප්‍රකට වන බව ය. සීගිරි ගී, සියබස්ලකර, මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ ආදි වූ සාහිත්‍ය ග්‍රන්ථවලින් ලංකාවට ආවේණික විචාර චින්තනයක මූලික ධර්මතා ගවේෂණය කළ හැකි ය. සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භක යුගයන්හි පැවති ස්වාධීන විචාර චින්තනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම පරමාර්ථය කරගත් මේ අධ්‍යයනයේ දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සෙනරත් පරණවිතාන විසින් සංස්කරණය කරන ලද සීගිරි ග්‍රැෆිටි, හේන්පිටගෙදර ඤාණසීහ හිමි විසින් සංස්කරණය කරන ලද සියබස්ලකර, මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ යන ග්‍රන්ථ ද, ද්විතීයික මූලාශ්‍රය වශයෙන් සම්භාව්‍ය සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කෘති අලළා ලියවුණු විචාර විමර්ශන කෘති ද උපයෝගී කරගැනේ. එසේ ම ලංකාවේ ආරම්භක යුගයන්හි රචිත පද්‍ය සාහිත්‍ය නිර්මාණවලින් වෙනත් සාහිත්‍යයක විද්‍යමාන නො වන ස්වාධීන විචාර චින්තා පැවති බව ප්‍රත්‍යක්ෂ කරගත හැකි වන්නේ ය. සංස්කෘත හා පාලි සාහිත්‍ය කෘතිවලට අනන්‍ය වූ විචාර මාර්ගයක් පැවතුණා සේ ම සිංහල සාහිත්‍ය විචාරයට ද ආවේණික වූ විචාර චින්තා පැවති බව තහවුරු කරගත හැකි වන්නේ ය.

**ප්‍රමුඛ පදඃ** සාහිත්‍ය නිර්මාණය, සාහිත්‍ය විචාරය, විචාරාත්මක චින්තනය, අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය